## 02

# අලුත් සහල් මංගල්‍යය පිළිබඳ අධ්‍යයනයක්.

*දිල්හානි, එච්. ජී.*[1]

ගොවි ජනතාවෝ කෙත සහ බැත සම්බන්ධ සියලු ම සුබ අවස්ථාවල දී සශ්‍රිකත්වය අපේක්ෂා කළහ. ක්‍රිස්තු පූර්ව පන්දහසකටත් පෙර පැවැති මොහෙන්දොජාරෝ හරප්පා ශිෂ්ටාචාර යුගවල දී ද මිනිසා 'ජගන්මාතා වන්දනාව' පැවැත්වූයේ ගොවිතැනේ සශ්‍රිකත්වය සහ සෞභාග්‍යය අපේක්ෂාවෙනි. සුබ දිනෙක සුබ නැකතකින් කැපූ රන්වන් ගොයමෙන් අලුත් සහල් පිළියෙල කොට අලුත් බත් පිස බුදුන් සහ දෙවියන් පිදීම අලුත් සහල් මංගල්‍යයේ දී සිදු වේ. මහින්දාගමනයත් සමඟ හෙළ ගොවි ජනතාව අතර පැරණි දඹදිව ගොවි ජනතාව දැක්වූ උතුම් පුද සිරිත, සිරිතක් සේ මුල් බැස ගත්තේ ය. අලුත් සහල් මංගල්‍යය විවිධ පළාත්වල කමත, විහාර, දේවාල, නිවෙස යන විවිධ ස්ථානවල සිදු කරනු ලබයි. අලුත් සහල් මංගල්‍යය එක ම ස්ථානයක සිදු නොකර කමත, විහාර, දේවාල, නිවෙස යන විවිධ ස්ථානවල පැවැත්වීමට හේතුවක් තිබිය යුතු ය. මම මෙහි දී වයඹ පළාතේ ප්‍රදේශ කිහිපයක් අධ්‍යයනය සඳහා යොදා ගත්තෙමි. විවිධ පළාත්වල අලුත් සහල් මංගල්‍යය විවිධ ස්ථානවල පවත්වන බව නිරීක්ෂණය කිරීමෙන් දැක ගත හැකි විය. එයට හේතු වූ පසුබිම සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. බෞද්ධ සංකල්පයකින් උපත ලද්දක් වුව ද අලුත් සහල් මංගල්‍යය දෙවියන් උදෙසා කෙරෙන පූජා විධියක් ලෙස ද ව්‍යාප්ත විය. ගොවියා තම කුඹුරු යායේ කිරි ඉතිරවීම සිදු කළේ ගොවිතැනේ ප්‍රධාන අංග වූ වැව හා කෙත ආරක්ෂා කර ගැනීමට දෙවියන්ගෙන් ලද ආශිර්වාදයට කෘතගුණ සැලකීමක් වශයෙනි. එමෙන් ම ගොවියෝ තම කුඹුරුවල අස්වැන්න නිවසට ගෙන ගොස් කමතේ දී ම බුදුන්වහන්සේ වෙනුවෙන් වී සහල් කර එම සහල් එකතු කොට ගමේ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් මෙම මංගල්‍යය පවත්වති. බෞද්ධ හා හින්දු දහම අනුව සෙසු පූජනීය ස්ථානවල ද වගා කන්නයෙන් කන්නයට අලුත් සහල් මංගල්‍යය පැවැත්වීමෙන් ගොවිතැනට මෙන් ම ගොවි ජනතාවට ද ආශිර්වාදයක් මෙන් ම ශාන්තියක් ද අපේක්ෂා කෙරෙන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ අලුත් සහල් මංගල්‍යය, පූජා මංගල්‍යය, ගොවි ජනතාව, අස්වැන්න, ජගන්මාතා වන්දනාව.

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*